**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - 2025**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ("විශ්වවිද්‍යාලය") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

මතය සඳහා සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- විශ්වවිද්‍යාලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු විසින් වසර 2 ක කාලයක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු.1,450,000 ක් වූ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා 2023 වර්ෂයේදී ලබාගත් රු.160,000 ක පර්යේෂණ ප්‍රදාන අත්තිකාරම එකී පර්යේෂණය සිදු කිරීමකින් තොරව මාස 12 කට ආසන්න කාලයකින් පසුව නැවත පියවා තිබුණි. | පර්යේෂණ ප්‍රදානයන් ක්ෂේත්‍ර පාදක අධ්‍යයනයන්ට යොදා ගැනීමේදී දැරිය හැකි වියදම් සම්බන්ධයෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව මඟින් පනවන ලද කොන්දේසි ප්‍රකාරව ඉහත අධ්‍යයනය ඉදිරියට කරගෙන යාමේදී අරමුදලින් වියදම් දැරීමට ගැටළු පවතින බැවින් ලබා ගත් අත්තිකාරම නැවත විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති බව. | අදාළ කොන්දේසි වලට අනුකූලව පවත්වාගෙන යා හැකි පර්යේෂණ සඳහා පර්යේෂණ ප්‍රදාන නිකුත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971අංක 38දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2019 ජූලි 29 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 4/2019 | ආයෝජනයන් සිදු කිරීමේදී අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතීන් ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2025 දෙසැම්බර් 31 දිනට රු.403,668,351 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | 2025 වර්ෂයට අදාළ සියළුම ආයෝජන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ 04/2019 ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ මුදල් කමිටු නිර්දේශ සහ පාලක සභා අනුමැතිය මත සිදුකර ඇත. කෙසේ වුවද, 2026 වර්ෂයට අදාළ ආයෝජන සඳහා මුදල්, සැලසුම් හා ආර්ථික අමාත්‍යාංශයේ අනුමැතියට යොමුකර ඇති බව. | මුදල් පනත හා අදාළ විශ්වවිද්‍යාල චක්‍රලේඛ පරිදි මුදල් ආයෝජනයට පෙර අදාළ අනුමැතීන් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තිය | මෙම පනත ක්‍රියාත්මක වන දින සිට වසරක් ඇතුළත එනම් 2025 අගෝස්තු 07 දිනට පෙර යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් විසුරුවා හැරීම හෝ ඉදිරියට පවත්වාගෙන යාම අවශ්‍ය වේ නම් භාණ්ඩාගාර ලේකම්වරයා විමසා වරයා විසින් තීරණය කරනු මුදල් අමාත්‍ය වස්ථාපිත අරමුදලක් ලැබුවහොත් එය ව්‍ය බවට පරිවර්තනය කරනු ලැබියයුතු වුවත් , එකතු වටිනාකම රු.2,453,143 ක් වූ අරමුදල් 03 ක් විසුරුවා හැරීමට හෝ ව්‍යවස්ථාපිත අරමුදල් බවට පරිවර්තනය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | එම ගිණුම් අරමුදල් ගිණුම් ලෙස ගිණුම්ගත නොවන අතර විශ්වවිද්‍යාල අරමුදල යටතේ වෙනම වැය ශීර්ෂ යටතේ ගිණුම්ගත කර ඇති බව. | විශ්වවිද්‍යාල අරමුදල් යටතේ ගිණුම්ගතවන මෙම අරමුදල් සඳහා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ 2021/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව නිකුත් කළ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 3.2 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන්වී මාස 05 ක් ගතවීමට පෙර සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම (APRM) පැවැත්විය යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ කාර්යසාධන සමාලෝචන රැස්වීම (APRM) 2026 මැයි මාසය තුළ පැවැත්වීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම පැවැත්විය යුතුය. |
| (ඈ) 2024 නොවැම්බර් 25 දිනැති ගැසට් ය මඟින් පත්‍ර කාශයට පත්කරන ප්‍ර ලද භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වූ සම්පාදන ප්‍ර මාර්ගෝපදේශ හසංග්‍රයේ 4.1.3 හා 4.1.1 (ආ) ඡේද | සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක්ම මධ්‍යකාලීන අයවැය රාමුව අනුව වසර 03 ක කාලයක් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ අදාළ සෑම ප්‍රසම්පාදන පැකේජයක් සඳහාම ලංසු කැඳවීමේ දිනයේ සිට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා අවසන් කිරීම දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, උප ක්‍රියාකාරකම් අදාළ පූර්ව හා/ හෝ පසු සමාලෝචන ක්‍රියාකාරකම් කාලවකවානු සහිතව ඇතුළත් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | 2025-2027 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම මේ වනවිට සකස්කරමින් පවතින බව සහ වාර්ෂික ප්‍රතිපාදන පිළිබඳ නිශ්චිතව දැනුම්දුන් පසු අප විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නිසි අනුමැතීන් ලබාගෙන ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |
| (ඉ) මුදල් හා ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන | වැටුප් හා වේතන, වෛද්‍ය සැපයුම් , ගිවිසුම්ගත බදුකුලී හා පළාත් පාලන ආයතන බදු විශ්‍රාමික ප්‍රතිලාභ, රාජ්‍ය | 2015 මාර්තු 13 වන දින පැවති 912 වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| අමාත්‍යාංශයේ 2025 මාර්තු 22 දිනැති අයවැය චක්‍රලේඛ අංක 1/2025 හි 3.1 ඡේදය | ණය සඳහා පොලී ගෙවීම්, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති සුභසාධන ගෙවීම් සහ ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම්ගත බැඳීම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස උපයෝජනය කළ යුතු අතර අනෙකුත් වියදම් පිරිමැසුම්දායී ලෙස පාලනයකින් යුතුව උපයෝජනය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම ලෙස දක්වා තිබුණද මුදල් අමාත්‍යාංශයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය විසින් සේවකයින් 205ක් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික අංශයේ රක්ෂණ ආයතනයක් වෙත රු.3,080,612 ක රක්ෂණ දායක මුදලක් ගෙවා තිබුණි . | වාරයේදී විශ්වවිද්‍යාල සේවකයින් සඳහා 2015 වර්ෂයේ සිට සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ස්ථාපිත කිරීම අනුමත කරන ලදි. ඒ අනුව මෙම විශ්වවිද්‍යාලය සඳහා ද සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් විවෘත මිල ගණන් කැඳවීම මත සපයා ගන්නා ලද බව | |
| (ඊ) 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214 /19/2023දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියෙහි 5 ඡේදය | බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කිරීම මත අයකර ගන්නා මුදල්, මූලික වශයෙන් අධ්‍යයන කාර්යයන් සඳහා වැටුප් සහිත/ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගත් විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අදාළ කාලය තුළ රජය විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා සිදුකරනු ලබන අයකිරීමක් වන හෙයින්, එම අරමුදල් වෙනත් කාර්යයන් සඳහා යොදවා නොගෙන ලද සැනින් රාජ්‍ය ආදායමට බැර කිරීමට අදාළ ආයතන විසින් කටයුතු කළ යුතු ලෙස දක්වා තිබුණද බැඳුම්කර උල්ලංඝනය කිරීම මත ප්‍රවර්ථන වර්ෂය තුළදී අයකර ගන්නා ලද රු.1,991,160 ක් ඇතුළු එකතුව රු.9,577,618 ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2022 නොවැම්බර් 09 දිනැති අංක UGC/DA/F/Bond Violation ලිපිය ප්‍රකාරව එම අරමුදල් විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා වෙනුවෙන් භාවිතයට ගැනීමට උපදෙස් ලබාදී ඇති බවද එම උපදෙස් අනුව දැනට කටයුතු කරමින් පවතින අතර, ඒ සම්බන්ධව ඉදිරියේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලැබෙන උපදෙස් අනුව කටයුතු කිරීමට සටහන් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

## 1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 ජූලි 18 දිනැති හා අංක SEC/2023/02 දරන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සේවා නියුක්තිකයන්හට සපයනු ලබන ගමනා ගමන, ප්‍රවාහන හෝ ඒ ආශ්‍රිත පහසුකම් සඳහා වූ ප්‍රතිලාභයේ සම්පූර්ණ වටිනාකම | ඉදිරියේදී මෙ සම්බන්ධව ලැබෙන උපදෙස් අනුව කටයුතු කරන බව. | නව චක්‍රලේඛ විධිවිධාන අනුව ප්‍රතිලාභයේ සම්පූර්ණ වටිනාකම අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද |

| | | |
|---|---|---|
| අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කිරීමේදී අදාළ කරගත යුතු වුවත්, ඊට පටහැනිව එම දීමනා වලින් සියයට 25 ක් පමණක් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් නිලධාරීන් 6 දෙනෙකුට අදාළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රු.1,056,150 ක් අඩුවෙන් අයකර තිබුණි. | | ගණනය කිරීමේදී අදාළ කරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.192,135,139 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.31,523,807 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.160,611,332 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හුවමාරු නොවන ගනුදෙනු මගින් ලද ආදායම් වැඩිවීම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු ආදායම රු.1,267,949,293 ක් වූ අතර 2024 වර්ෂයේදී එය රු.954,171,502 ක් වීමෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 36 ක වර්ධනයක් ඇතිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු මෙහෙයුම් වියදම රු.932,470,512 ක් වූ අතර 2024 වර්ෂයේදී මුළු මෙහෙයුම් වියදම් රු.805,488,497 වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ මුළු මෙහෙයුම් වියදම රු.126,982,015 කින් හා සියයට 16 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

දේශීය වෛද්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම, දේශීය වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හරහා ඒ පිළිබඳ රාජ්‍ය උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම, දේශීය වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක පර්යේෂණ සහ නවෝත්පාදන හරහා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම විශ්වවිද්‍යාලයේ අරමුණු අතර වේ.
එම අරමුණු ඉටුකර ගැනීම සඳහා දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ 04 ක අධ්‍යයනාංශ 14 ක් පිහිටුවා ඇති අතර ඒ මගින් ප්‍රථම උපාධි වැඩසටහන් 9 ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 6 ක් පිරිනමනු ලබයි. 2025 වර්ෂයේ විශ්වවිද්‍යාලය විසින් ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 505 ක් බඳවා ගෙන තිබූ අතර 2025 වර්ෂයේ උපාධිධාරීන් 83 ක් හා පශ්චාත් උපාධිධාරීන් 43 ක් බිහිකර තිබුණි.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වංචා දූෂණ අවම වන පරිදි ශක්තිමත් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමකින් තොරව ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවා සැපයීම, ශාස්ත්‍ර | “සිය සුවය” ව්‍යාපෘති යෝජනාව යළි සමාලෝචනය කරන ලෙස උපදෙස් ලබාදී ඇත. ඒ අනුව නව ව්‍යාපෘති යෝජනාව 2026 මැයි මස පාලක | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් හඳුන්වාදීම හා එම ක්‍රමවේදයන් |

| | | | |
|---|---|---|---|
| | අයකිරීම, රිසිට්පත් නිකුත් කිරීම ඇතුළු සම්පූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ඉතා දුර්වල ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් වෛද්‍යවරයා වෙත පවරා තිබුණි. | සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් පසු, එහි ඇතුළත් ක්‍රියාකාරකම් සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ක්‍රියාත්මක කර ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවා සැපයීම හා ආදායම් රැස්කිරීම පාලනයකින් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 03 දිනැති අංක 1/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4(i) ඡේදය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ xxiii පරිච්ඡේදය 2.6 හා ඡේද 2.9 ප්‍රකාරව පුස්තකාල පොත් එකතුව 100,000 ට වඩා අඩු නම් පුස්තකාල ද්‍රව්‍ය සත්‍යාපනය වාර්ෂිකව සිදුකළ යුතු අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් පුස්තකාල පොත්, වාර සඟරා ආදිය සමීක්ෂණයට භාජනය කළ යුතු බව දක්වා ඇතත් පුස්තකාල පොත් සමීක්ෂණය සඳහා මණ්ඩලයක් පත්කර නොතිබුණි. | පුස්තකාල පොත් සමීක්ෂණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ xxiii පරිච්ඡේදය 2.15 ඡේදය අනුව සිදු කරනු ලබන බව. | චක්‍රලේඛය පරිදි පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 3.1 වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කරනු පිණිස ඉලෙක්ට්‍රොනික ඇඟිලි සලකුණු යන්ත්‍රයක් / වෙනත් එවැනි මෙවලමක් යොදා ගත යුතු අතර ,එවැනි යන්ත්‍රයක් නොමැති අවස්ථාවකදී පැමිණීම සහ පිටවීම සටහන් කිරීමේ ලේඛනයක් යොදා ගත යුතු වුවත් විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම ලේඛනයක් / යන්ත්‍රයක් භාවිතයෙන් විධිමත් ලෙස තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.312,696,970 ක් ගෙවා තිබුණි. | අදාළ අධ්‍යනාංශ ප්‍රධානී මඟින් එකී අධ්‍යනාංශයට අනුයුක්ත සියළුම අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම තහවුරු කරගැනීම මත වැටුප් ගෙවීම සිදුකරනු ලබන බව හා එහිදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ 01/2018 අනුව කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව පැමිණීම පිටවීම නිවාඩු සටහන් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය කෙරෙහි පවතින සිසු ආකර්ෂණය අඩු වීම හා පාඨමාලා සඳහා සිසුන්ගේ ඉල්ලීම් අඩුවීම හේතුවෙන් පසුගිය වසර 05 ක කාලය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයට බඳවා ගැනීමට නියම කරන ලද සිසුන් සංඛ්‍යාව සහ විශ්වවිද්‍යාලය විසින් එක් එක් අධ්‍යයන අංශය සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අතර සියයට 19 සිට සියයට 64 දක්වා පරාසයක ඌනතාවයක් ඇතිවී තිබුණි. | මේ වනවිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එක්ව විශේෂිත කමිටු පත්කර පාඨමාලා පිළිබඳ පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | පාඨමාලා සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර සිසු ආකර්ෂණය වර්ධනය කිරීම සඳහා නව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | දේශීය සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ පීඨයේ දෙපාර්තමේන්තු 03 ක 2020/2021, 2021/2022, 2022/2023 අධ්‍යයන වර්ෂවල විභාගයන්ට පෙනී සිටි සිසුන්ගෙන් සැලකිය යුතු සිසුන් පිරිසක් විභාග අසමත් වී තිබුණි. මෙසේ විභාග අසමත් වීම විභාගයට පෙනී සිටි සිසුන්ගේ ප්‍රතිශතයක් ලෙස සියයට 26 සිට සියයට 70 දක්වා පරාසයක විය. | ශිෂ්‍යයින්ගේ සමත් වීම් ඉහළ දමමින් වඩාත් ඵලදායී උපාධිධාරීන් රැකියා වෙළඳපොළ වෙත මුදා හැරීමේ වගකීම සම්බන්ධයෙන් දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ පීඨාධිපති ඇතුළු සියළුම වගකිවයුතු නිළධාරීන් දැනුවත් කරන ලද බව සහ නිබන්ධන ක්‍රියාකාරකම්, ක්ෂේත්‍ර චාරිකා, ආරාධිත දේශන, විවිධ වැඩමුළු ආදිය සංවිධානය කර විෂයන් කෙරෙහි තිබෙන උනන්දුව වැඩි දියුණු කිරීමට පීඨය මඟින් මේ වන විටත් කටයුතු සිදුකරගෙන යනු ලබන බව. | ශිෂ්‍යයන් විභාග අසමත් වීමට හේතු වූ කරුණු විමර්ශනය කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව විභාග පවත්වනු ලබන දින සිට මාස 03 ක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් උපාධි පාඨමාලා 08 කට අයත් විෂයන් 82 ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 05 සිට මාස 11 දක්වා කාලයක් ගතවී තිබුණි. | උපාධි පාඨමාලා අනු නීති සකස් කිරීමට සිදුවීම, කාර්යමණ්ඩල හිඟය, අධ්‍යයන සේවක/ පරිපාලන සේවා වැඩ වර්ජනය, බාහිර දේශකවරුන් වැඩිපුර කාලයක් ලබා ගැනීම, පූර්ව ප්‍රතිඵල කමිටු රැස්වීම් වලදී හඳුනා ගනු ලැබූ දෝෂයන් හා අනු නීති පිළිබඳ ගැටලු නිවැරදි කිරීම, සිසුන් විසින් ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය සහතික පිළිබඳ කටයුතු කිරීම ආදිය හේතුවෙන් ප්‍රතිඵල ප්‍රමාද වී ඇති බව. | විභාග පවත්වනු ලබන දින සිට මාස 3 ක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ xxiii | අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන ඇති භාණ්ඩ මේ වනවිට වෙන්දේසි කිරීම සඳහා මිල | භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කිරීම |

| | | |
|---|---|---|
| පරිච්ඡේදයේ 4.10 හා 4.10 (අ) ඡේද ප්‍රකාරව තම ආයතනයේ ගොඩගැසී තිබෙන භාවිතයට නුසුදුසු වත්කම් සෑම මාස තුනකට වරක්ම (03) සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කරමින් බැහැර කළ යුතු වුවත්, 2024 වර්ෂයේ පැවති භාණ්ඩ සමීක්ෂණය මඟින් අපහරණය කිරීම සඳහා හඳුනාගත් භාණ්ඩ අයිතමයන් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගණන් කැඳවා ඇත. | සඳහා හඳුනාගත් භාණ්ඩ කඩිනමින් අපහරණය කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) "සිය සුවය" ව්‍යාපෘතිය යටතේ රු.2,183,000ක වියදමක් දරා විකුම් උයනෙහි ඉදිකර තිබූ වෙළඳකුටි 10ක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඉදිකර ඇති වෙළඳ කුටි නිසි පරිදි යොදා ගනිමින් ඉපයීම් ඉහළ නැංවීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව. | උක්ත වෙළඳ කුටි ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) "සිය සුවය" ව්‍යාපෘතියට අයත් ආයුර්වේද ප්‍රතිකාර හා උපදේශන මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන කුලී ගොඩනැගිල්ලේ තෙවන මහලේ කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශයට අයත් ඇඳන්, පුටු, මේස ඇතුළු වත්කම් රැසක් භාවිතයට නොගෙන ගොඩගසා තිබුණි. | මෙම උපකරණ කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය යටතේ පවත්වන රූපලාවන්‍ය පාඨමාලා සඳහා සති අන්ත දිනවල භාවිතයට ගැනීම සඳහා ලබාදී ඇති බව. | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අංශයන් කඩිනමින් භාවිතයට ගතහැකි පරිදි සංවර්ධනය කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "සිය සුවය" ව්‍යාපෘතියට අයත් ආයුර්වේද ප්‍රතිකාර හා උපදේශන මධ්‍යස්ථානය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් 11 ක් සැලසුම් කර තිබුණු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණ ද යෝජිත ක්‍රියාකාරකම් 06 ක් ආරම්භ කර නොතිබුණු අතර දේශීය ආහාර අලෙවිසැලෙහි කටයුතු ආරම්භ කර වසර 1 ½ කට අධික කාලයක් ගතවී ඇතත් ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත් ක්‍රියාකාරකම් 11 න් ක්‍රියාකාරකම් 05 ක් ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි. | "සිය සුවය" ව්‍යාපෘති යෝජනාව යලි සමාලෝචනය කර එහි ඇතුළත් ක්‍රියාකාරකම් සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ව්‍යාපෘතියෙහි ඇතුලත් සියළුම ක්‍රියාකාරකම් කඩිනමින් අවසන් කල යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය නේවාසික පහසුකම් පිළිබඳ නිසි තක්සේරුවකින් තොරව ශිෂ්‍යයන් 189 ක් හා ශිෂ්‍යාවන් 299 ක් සඳහා නේවාසිකාගාර 12 ක් කුලී පදනම මත පෞද්ගලික අංශයෙන් මිලදී ගැනීම හේතුවෙන් ශිෂ්‍යයන් 30 දෙනෙකු සහ ශිෂ්‍යාවන් 51 දෙනෙකු ලෙස මුළු සිසුන් 81 දෙනෙක් වෙනුවෙන් අනවශ්‍ය ලෙස නේවාසිකාගාර කුලියට ගෙන තිබුණි. | සම්පූර්ණ ධාරිතාවය මේ වනවිට යොදාගෙන නේවාසික පහසුකම් පිරිනමා ඇති බව. | නිවැරදි අවශ්‍යතාවය පුරෝකථනය කර නේවාසිකාගාර කුලියට ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කලයුතු වුවත් 2022 හා 2023 වර්ෂවලදී විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබූ රජයේ වාහන 06 ක් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | භාවිතා කරන සියළුම වාහන ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රජයේ වාහන නඩත්තු කිරීම සම්බන්ධයෙන් වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත් වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු බව දක්වා ඇතත් විශ්වවිද්‍යාලය ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව ඉන්ධන පරීක්ෂාව සිදුකළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව වැනි පොදු ආකෘතිය පරිදි 267 එක් එක් වාහනය වෙනුවෙන් වාහන ලොග් සටහන් පොතක් නඩත්තු කලයුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් එවැනි ලේඛන යාවත්කාලීනව හා සම්පූර්ණව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලොග් පොත් නිසි ආකාරයෙන් යාවත්කාලීන කොට පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබාදී කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලොග් පොත් නඩත්තු කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "සිය සුවය" ව්‍යාපෘතියේ රු.14,862,500 ක් වූ අදියර 2 වියදම් ඇස්තමේන්තුව රු.34,718,179 ක් ලෙස වියදම සියයට 134 කින් වැඩිකර සංශෝධනය කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛන ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | පළමු අයවැය හා දෙවන සංශෝධිත අයවැය අතර වියදම 134% කින් වර්ධනය වී ඇත්තේ පාරිභෝගික ප්‍රතිපෝෂක අදහස්, ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් හඳුනාගත් නව සැලසුම් සහ අවශ්‍යතා වෙනුවෙන් වූ යෝජිත ඉදිකිරීම් සඳහා අයවැය තුළ ප්‍රතිපාදන වෙන් කළ බැවින් බව. | නිසි පුරෝකථනයකින් යුක්තව අයවැය පිළියෙල කළ යුතුය. |